# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
# (මෙට්‍රොපොලිටන් මණ්ඩපය)
# තාවකාලික පදනම මත වැඩසටහන් සහකාරවරුන් සහ වැඩසටහන් නිළධාරීන් බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මෙට්‍රොපොලිටන් මණ්ඩපයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර ස්ථිර මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු අංශ ප්‍රධානීගේ නිර්දේශය මත සහ උපකුලපතිවරයාගේ අනුමැතියට යටත්ව සේවා කාලය අර්ධ වාර්ෂි කව දීර්ඝ කළ හැක.
- විශ්වවිද්‍යාලයීය ආකෘති පත්‍රයට අනුව පිළියෙල කළ අයදුම්පත් සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2024.02.12

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන්(https://kdu.ac.lk)භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්.ඩී.කේ.සී.සන්දනායක
වැඩබලන ලේඛකාධිකාරී

## වැඩසටහන් නිළධාරී (තාවකාලික)

අවම සුදුසුකම්

01. i. සිංහල භාෂාව / දෙමළ භාෂාව
    ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
    iii. ගණිතය

    යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

    සහ

02. එක් වරකදී අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සියළුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

03.පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා මට්ටම හෝ ඊට ඉහළ සුදුසුකම්

(ආ) පහත සඳහන් ක්ෂේත්‍රයන්හි පළපුරුද්ද

i. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
ii. වැඩසටහන් ආශ්‍රිත ප්‍රතිපත්ති සහ භාවිතයන් සහතික කිරීම
iii. නව වැඩසටහන් හඳුන්වාදීම සහ වැඩසටහන් විෂයමාලා සංවර්ධනය

(ඇ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් භාවිතය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබද වසර 02 ක පළපුරුද්ද

වයස:අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු.18ට නොඅඩු සහ වයස අවු.30 ට නොවැඩි විය යුතුය.

මාසික දීමනාව

රු. 53,175/- ක ස්ථිර මාසික දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා.

අනෙකුත් වරප්‍රසාද

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම සහ අනෙකුත් වරප්‍රසාද.

## වැඩසටහන් සහකාර (තාවකාලික)

අවම සුදුසුකම්

01. i. සිංහල භාෂාව / දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
iii. ගණිතය

යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

02. එක් වරකදී අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සියළුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

03.පහත සදහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් භාවිතය පිළිබද පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබද වසර 02 ක පළපුරුද්ද.

වයසඃඅයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු.18ට නොඅඩු සහ වයස අවු.30 ට නොවැඩි විය යුතුය.

මාසික වැටුප

රු. 37,970/- ක ස්ථිර මාසික දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා.

අනෙකුත් වරප්‍රසාද

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම සහ අනෙකුත් වරප්‍රසාද.